Article 12 (1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019-11-07 |

පැමිණිලිකාර පාර්ශය : එච්.ඩබ්.එම්. අජිත් ප්‍රසන්න මයා,
අංක 26, බෞද්ධ මධ්‍යස්ථාන පාර,
ගල්බොරැල්ල, කැලණිය.

වගඋත්තරකාර පාර්ශය : විදුහල්පති,
විශාඛා විද්‍යාලය,
අංක 133, වජිර පාර,
කොළඹ 05.

පැමිණිලි අංකය : **HRC/3243/17**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් 2017-10-17 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන එච්.ඩබ්.එම්. භාව්‍යා විහාරි කෞෂල්‍යා ඉහත වගඋත්තරකාර විදුහලට ඇතුළත් කිරීම සඳහා ආසන්නතා පදනම යටතේ (CO 222) අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලද නමුත්, කුලී පදනම මත ගිවිසුම ලියාපදිංචි නොකිරීමේ හේතුව මත තමාව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා නොමැති බවත්ය. තවද පැමිණිලිකරු "අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 2017-09-19 වන දිනැති ලිපිය අනුව 22/2017 යටතේ ඉදිරිපත් කරන ලද චක්‍රලේඛයේ 7.1.3 උපවගන්ති ඉවත් කර ඇතත්, එක් එක් ගණයන් යටතේ නිර්නායකත්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතු බව එමගින් ගම්‍ය නොවන බ්වටද" සඳහන් කර ඇති බව කොමිෂන් සභාවේ අවධානයට ලක්කොට ඇත. ඒ අනුව "නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් එක් කොටසක් සම්පූර්ණ නොකිරීම මත සම්පූර්ණ ලකුණු ලබා නොදීම හෝ ප්‍රතික්ෂේප නොකළ යුතු බවට" සඳහන් කර ඇති බවද දන්වා ඇත. ඒ අනුව තම දරුවාට ලැබිය යුතු ලකුණු සංඛ්‍යාව ලබා දුන්නේ නම් මේ වන විටත් අදාළ වගඋත්තරකාර විද්‍යාලයේ තම දරුවා අධ්‍යාපනය ලබන බවත්, තමාට ඡන්ද හිමිකම වෙනුවෙන් ලකුණු 30ක්ද, අමතර ලේඛන සඳහා ලකුණු 05ක්ද, ආසන්නතාවය සඳහා ලකුණු 50ක්ද හිමිවිය යුතු වන



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බව පැමිණිලිකරු කොමිෂන් සභාවට දන්වා ඇත. ඒ අනුව මේ පිළිබඳව අවධානය යොමු කර තමාට සහනයක් ලබා දෙන මෙන් පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත්තේ, ආසන්නතා පදනම මත අයදුම්පතක් යොමු කර ඇති බවත්, එය CO 222 යටතේ ලියාපදිංචි වී ඇති බවත් දක්වා ඇත. පැමිණිලිකරු වෙත 2012 වසරේ සිට 2016 වර්ෂය දක්වා ඡන්ද හිමි ලේඛනයේ නම සඳහන් වී තිබීම මත ලකුණු 30ක් චක්‍රලේඛ ප්‍රකාරව ලබා දිය හැකි බවත්, 22/2017 චක්‍රලේඛයට අදාලව 7.2.3 යටතේ පදිංචිය සනාථ නොවන්නේ නම් ලකුණු අවලංගු කල හැකි අතර, ඡන්ද නාම ලේඛනයට පමණක් ලකුණු 30ක් ලබාදිය හැකි නමුත් අමතර ලේඛන සඳහා ලකුණු ලබාදිය නොහැකි බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත් අදාළ වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට දන්වා ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු ආසන්නතා පදනම මත CO 222 යටතේ අයදුම්පත්‍රයක් යොමු කර ඇතත්, '22/2017 චක්‍රලේඛයෙහි 7.2.2.1 අනුව පදිංචි ස්ථානයේ හිමිකම යටතේ අදාළ ලකුණු ලබා දීමට අවස්ථාවක් නොමැත' යනුවෙන් පැමිණිලිකරු වෙත දන්වා ඇත.

තවද 2017-07-31 දිනැති පාසල්වලට ළමුන් ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛ අංක 22/2017 හි 7.1.3 යටතේ, 'මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබාදෙන හෙයින් ලකුණු ලබා දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද, ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර, එවැනි අවස්ථාවල එම ගණය සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය' වශයෙන් දක්වා ඇත.

කෙසේ වෙතත්, නැවතත් 2017.07.01 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම පාසල් විදුහල්පතිවරුන් වෙත අංක 22/2017 (1) දරණ චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛය අනුව ඉහත කී 22/2017 චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බවට දක්වා තිබීම හේතුවෙන් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ අවස්ථාව වන විට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාවක් ලැබී තිබූ බවට නිරීක්ෂණය වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017.09.19 වන දින සියලුම පාසැල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපියෙහි දෙවන ඡේදය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පලමුවන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීමට අදාල 2017-05-30 දිනැති 22/2017 චක්‍රලේඛය සම්බන්ධයෙන් විවිධ පාර්ශව වලින් තවදුරටත් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අනුව 22/2017(1)

චක්‍රලේඛය සංශෝධනය කර ඇත. මෙම සංශෝධනය අනුව චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය ඉවත් කර ඇතත්, එක් එක් ගණයක් යටතේ නිර්නායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතුය යන්න එමගින් දක්වා නැත. තවද එම ලිපියේ 3 වන ඡේදයට අනුව 22/2017 චක්‍රලේඛයේ අදාල ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ගණයට අදාල ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාල ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය යනුවෙන් දක්වා ඇත. පැමිණිලිකරු විසින් ඉල්ලා ඇති ආසන්නතා ගණය යටතේ මූලික සුදුසුකම් සපුරා ඇති බවද වැඩිදුරටත් ඉදිරිපත් කර ඇති ලේඛන වලින් කරුණු අනාවරණය වේ.

22/2017 චක්‍රලේඛයේ අදාල ගණයන් සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාල ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාල ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණ ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතු බව දන්වා ඇත.

එසේම විශේෂයෙන්ම පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ දරුවන්ගේ මූලික සුදුසුකම වනුයේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි වී සිටීමය. පදිංචිය තහවුරු කරන ලේඛන යටතේ වන පදිංචි ස්ථානයේ හිමිකම යන්න ලකුණු පටිපාටියේ අන්තර්ගත එක් නිර්නායකයක් පමණක් බව දන්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු ආසන්නතා පදනම යටතේ ඉල්ලුම් කර ඇති අතර, පැමිණිලිකරුට ඡන්ද නාම ලේඛනයට ලකුණු 30ක්ද, අතිරේක ලේඛන වශයෙන් ඉදිරිපත් කර ඇති ජාතික හැඳුනුම්පත සඳහා ලකුණු 0.5ක්ද, පාසලට ආසන්නතාවය වෙනුවෙන් ලකුණු 50ක්ද හිමි වන බව නිරීක්ෂණය වේ. එසේම විශාඛා විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට මෙම පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැත. ඒ අනුව මෙම පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට හා අභියාචනා මණ්ඩලයට සහභාගී වී මූලික සුදුසුකම් මත ලකුණු ලැබීමට හිමිකම් ඇති බව නිරීක්ෂණය වේ.

ආසන්නතා ගණය චක්‍රලේඛය තුළ ඉතා නිවැරදිව අර්ථකතනය කොට ඇති අතර, ආසන්නතා ගණය යටතේ දරුවන් ඇතුලත් කර ගත යුත්තේ කුමන ආකාරයට යන්න නිවැරදිව දක්වා ඇත. චක්‍රලේඛයේ ඇතුලත් නිර්නායකයන් යටතේ ඉතා නිවැරදිව ආසන්න පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනාගැනීමට නීත්‍යානුකූල හැකියාව තිබියදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය මෙම පැමිණිලිකරු පිළිබඳව සලකා බලා නොමැති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

වගඋත්තරකාර පාර්ශවය අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර අත්තනෝමතික ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති

මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන එච්.ඩබ්.එම්. භාව්‍ය විහාරි කෞෂල්‍යා වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අදාලව ඉදිරිපත් කර ඇති ලේඛන අනුව ලකුණු ලබා දීම සිදු කළ යුතු බවත්, ඒ අනුව පැමිණිලිකරු කඩයිම් ලකුණු සීමාව කරා ප්‍රවිෂ්ඨ වන්නේ පැමිණිලිකරුගේ දරුවා සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.12.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ගරු අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/